# සිංහල භාෂාවෙන් ඉස්ලාම් විෂය හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග - බණ්ඩාරවෙල ප්‍රදේශය පදනම් කරගත් අධ්‍යයනයක්

M.N.P. Rumana[1] , K. Suhaila[2], T.F.F. Thaila[3] & S.M.M. Mazahir[4]

[1] Department of Arabic language, Faculty of Islamic Studies and Arabic Language,
South Eastern University of Sri Lanka
[2,3&4] Department of Islamic studies, Faculty of Islamic Studies and Arabic Language,
South Eastern University of Sri Lanka
frumana1998@gmail.com, suhailasiththi98@gmail.com, thailafassy@gmail.com, mazahirsmm@seu.ac.lk

***සාරාංශය***

*ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පාසල් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව මෙරට පාසල් සිසුන්ට ලැබී ඇත. පාසල් අධ්‍යාපන විෂයමාලා තුළ 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අනිවාර්ය විෂයක් ලෙස ආගමික විෂය හැදෑරිය යුතුව තිබේ. සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂයක් ලෙස හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග හා ඊට හේතු සාධක හඳුනා ගැනීම මූලික අරමුණ කරගත් මෙම අධ්‍යයනය බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපය කේන්ද්‍ර කොට ගනිමින් සිදු කර ඇත. ඒ අනුව බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයට අයත් පාසල් අටක් තෝරා ගනිමින් එහි අධ්‍යාපනය හදාරන සිසුන්, ඔවුන්ගේ දෙමව්පියන්, ගුරුවරුන්, ගම්වාසීන් හා රජයේ නිලධාරීන් යන සියල්ලන්ගෙන් අදහස් විමසමින් මෙම අධ්‍යයනය සිදුවිය. එම ලබාගත් දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව පසක් වූයේ ඉස්ලාම් ධර්මය විෂය ඉගෙන ගැනීම සඳහා රජයේ ගුරුවරුන්, අදාල රජයේ පෙළපොත් ආදී අත්‍යවශ්‍ය පහසුකම් නොතිබීම හා විවිධ පාර්ශවයන්ගේ බලපෑම් වැනි බොහෝ හේතු සාධක මත එම සිසුන්ගෙන් වැඩි පිරිසකට සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ අවස්ථාව අහිමි වී ඇති අතරම මෙවන් අභියෝග රැසකට මුහුණ දෙමින් සමහරක් සිසුන් එම විෂය බාහිරවද හදාරා ඇති බවයි. එමෙන්ම ඉස්ලාම් විෂය හැදෑරීමේ අවස්ථාව අහිමි වූ බොහෝ සිසුන් ඒ වෙනුවට වෙනත් ආගමික විෂයක් හැදෑරීමට සිදුව ඇති බව මෙම අධ්‍යනයෙන් තවදුරටත් හඳුනාගත හැකි විය. මෙම ගැටලුව විසඳීමෙහිලා සිසුන්, දෙමව්පියන් ඇතුළු අනෙකුත් පාර්ශවයන් ප්‍රායෝගික තලයේ යෝජනා රැසක් ඉදිරිපත් කර ඇති අතර එය හුදෙක් යෝජනා ලෙස පමණක් නොපවත්වා නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තුළින් සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග වලට ස්ථිර විසඳුමක් ලබා දිය හැකිය.*

**කේන්ද්‍රීය වචන: සිංහල භාෂාව, ඉස්ලාම් ධර්ම විෂය, බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපය, අභියෝග, පාසල් සිසුන්**

## 1. හැදින්වීම

ශ්‍රී ලංකාවේ " අධ්‍යාපනය " මූලික මානව අයිතිවාසිකමක් වන අතර 1945දී හඳුන්වා දෙනු ලැබූ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුම කිසිදු භේදයකින් තොරව සමානව විධිමත් අධ්‍යාපනය නොමිලේ ලබාගැනීමේ අවස්ථාව උදාවිය. ශ්‍රී ලංකා රාජ්‍ය නීතියට අනුව, සෑම පුරවැසියෙකු ම වයස අවුරුදු පහ සිට දහසය දක්වා අධ්‍යාපනය ලැබීම අනිවාර්යය වේ. ඒ අනුව, ශ්‍රී ලංකා රජය සිසුන්ගේ පාසල්

අධ්‍යාපනය සඳහා අවශ්‍ය නිල ඇඳුම්, පාසල් පෙළ පොත් ඇතුළු අවශ්‍ය බොහෝ පහසුකම් නොමිලේ ලබා දෙනු ලබයි . ශ්‍රී ලංකාවේ පාසල්, ජාතික පාසල් හා පළාත් පාසල් වශයෙන් වර්ග කළ හැකි අතර ශ්‍රී ලංකාවේ බොහොමයක් පාසල් පළාත් පාසල් වේ. එනම්, ජාතික පාසල් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කළමනාකරණය කරමින් පාලනය කරන අතර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් පාසල් කළමනාකරණය කරනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රධාන අංශ තුනක් දැකගත හැක. එනම් ප්‍රාථමික අධ්‍යාපනය (1 ශ්‍රේණිය සිට 5 දක්වා), ද්විතීක අධ්‍යාපනය (6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා) සහ තෘතීක අධ්‍යාපනය (12 ශ්‍රේණිය සිට 13 දක්වා) යනාදී අංශයන් වේ. රජයේ පාසල්වල අධ්‍යාපන කටයුතු ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපන ක්‍රමය යටතේ, 1 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් මව් භාෂාව, ගණිතය ,ආගම වැනි විෂයන් අනිවාර්යෙන් ඉගෙන ගත යුතු අතර 10,11 ශ්‍රේණි වන විට අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සඳහා අනිවාර්ය විෂයන් ලෙස මව්බස, ගණිතය, විද්‍යාව, ආගම, ඉතිහාසය හා ඉංග්‍රීසි භාෂාව යනාදී අනිවාර්ය විෂයයන් 6ට අමතරව තවත් විෂයන් තුනක් සිසුන්ට සිය කැමැත්ත මත තෝරා ගත හැකිය. එම විෂයයන් සිංහල හා දෙමළ නිල භාෂාවෙන් හැදෑරීමේ අවස්ථාව සිසුන්ට ලබා දී ඇත .එම විෂයන් අතරින් ආගමික විෂය ලෙස බොහෝ විට සිසුන් තෝරා ගනු ලබන්නේ තමන් අදහන ආගමික විෂයයි. මේ අනුව වර්තමානයේ ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපන ක්‍රමය යටතේ අනෙකුත් අධ්‍යාපනික විෂය මාලාවට අමතරව බුද්ධාගම, ක්‍රිස්තියානි ධර්මය කතෝලික ධර්මය, හින්දු ආගම, ඉස්ලාම් ධර්මය යනාදී ආගමික විෂයයන් ඉගෙන ගැනීමේ අවස්ථාව හා නිදහස සිසුන්ට ලැබී ඇත.

ශ්‍රී ලංකාව වැනි බහුවාර්ගික රටක විධිමත් ආගමික ඉගැන්වීම් පාසල් අධ්‍යාපනය හරහා සිසුන්ට ලබා දීම අත්‍යවශ්‍ය වේ.පොත් පත්හි දැනුමෙන් ඔබ්බට සිසුන්ට විනය සාරධර්ම ඇතුළු යහපත් ගුණධර්ම යනාදීන් ලබා දීම පාසලින් සිදුවිය යුතුය. කෙසේ වෙතත් ආගම ආගමික පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් පාසල තුළින් ලබා දීම සිසුන්ගේ මෙන්ම රටේ අනාගතයට ඉතා වැදගත් ය.මේ තුළින් සිසුන්ට තමන් අදහන ආගම පිළිබඳ නිවැරදි දැක්මකින් හා එහි යථාර්ථය අවබෝධ කරගනිමින් කටයුතු කිරීමට අවශ්‍ය විධිමත් දැනුමක් ලබා දිය හැක. තවද ආගම සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනය පාසල හරහා ලබා දීම තුළින් ආගම පිළිබඳව වැරදි මතයන් දැරීම, වැරදි ආකාරයෙන් ආගම අවබෝධ කරගැනීම,පිළිපැදීම වැනි සෘණාත්මක බලපෑම් වැළැක්වීමට ද හැකිවේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන විෂය මාලාව තුළ ඇති ආගමික අධ්‍යාපන යන විෂය ඉගෙනීමේ අවස්ථාව සිසුන්ට ලබා දීම යහපත් ඵලදායි කාරණයකි. ඒ අනුව සිසුන් තමන් අදහන ආගම විෂයක් ලෙස තෝරා ගනිමින් අධ්‍යාපනය ලැබීමේ හැකියාව හා අයිතිය ඔවුන්ට ලැබී ඇත. එසේ සිසුන් හදාරන ආගමික විෂය ඔවුන් අදහන ආගම හා ඔවුන්ගේ කැමැත්ත මත තීරණය වේ.

ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපන විෂය මාලාවේ ආගමික විෂයයන් අතරින් ඉස්ලාම් ධර්ම විෂය ද එක් ආගමික විෂයක් ලෙස උගන්වනු ලබයි. ඉස්ලාම් දහම අදහන බොහෝ සිසුන් ඉස්ලාම් ධර්ම විෂය හදාරන අතර සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගනු ලබන සිසුන් ද ඉස්ලාම් විෂය සිංහල මාධ්‍යයෙන් හදාරනු ලබයි. මෙම අධ්‍යයනය තුළින් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂය හදාරන සිසුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව බණ්ඩාරවෙල ප්‍රදේශය පදනම් කරමින් විශ්ලේෂණය කර ඇත. ශ්‍රී ලංකා ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ පාසල් 144 ක් ඇති අතර ඉන් 134ක් පළාත් පාසල් වන අතර දහයක් ජාතික පාසල් වේ. මෙම පාසල්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු සිදුවෙමින් පවතී. එමෙන්ම බණ්ඩාරවෙල ප්‍රදේශයේ පාසල් අටක් කේන්ද්‍ර කොට ගනිමින් මෙම අධ්‍යානය සිදු කර ඇති අතර එම පාසල් වල තොරතුරු පහත වගුවේ දැක්වේ.

| කොට්ඨාශය | පාසලේ නම | වර්ගය | මාධ්‍යය | සමස්ත සිසුන් ගණන | ජාතික/පළාත් | මිශ්‍රණය | ජන වර්ගය |
|---|---|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | බ/මධ්‍ය මහා විද්‍යාලය | 1AB | සිංහල | 5500 | ජාතික | මිශ්‍ර | සිංහල |
| බණ්ඩාරවෙල | බ/විශාකා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය | 1AB | සිංහල | 2000 | ජාතික | කාන්තා | සිංහල |
| බණ්ඩාරවෙල | බ/ශාන්ත ජෝශප් ම.ම විද්‍යාලය | 1AB | සිංහල | 2500 | ජාතික | මිශ්‍ර | සිංහල |
| බණ්ඩාරවෙල | බ/ කුඩා කුසුම් බාලිකා ම.ම විද්‍යාලය | 1AB | සිංහල | 1800 | ජාතික | කාන්තා | සිංහල |
| බණ්ඩාරවෙල | බ/සීවලි නවෝද්‍යා විද්‍යාලය | 1C | සිංහල | 1500 | පළාත් | මිශ්‍ර | සිංහල |
| බණ්ඩාරවෙල | බ/ශාන්ත තෝමස් විද්‍යාලය | 1AB | සිංහල | 2800 | ජාතික | පිරිමි | සිංහල |
| බණ්ඩාරවෙල | බ/ධර්මපාල නවෝද්‍යා විද්‍යාලය | 1AB | සිංහල | 2500 | පළාත් | මිශ්‍ර | සිංහල |
| බණ්ඩාරවෙල | බ/ ධර්මාශෝක ම.ම විද්‍යාලය | 1AB | සිංහල | 2500 | ජාතික | මිශ්‍ර | සිංහල |

එම පාසල්වල බෞද්ධ, මුස්ලිම් හා අනෙකුත් ආගමික සිසුන් තම පාසලේ අදාල භාෂා මාධ්‍යයෙන් පාසල් අධ්‍යාපනය හදාරනු ලබයි. එම සිසුන් තමන් අදහන ආගම ඔවුන් හදාරන ආගමික විෂයක් ලෙස ඉගෙන ගනී. එනමුත් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ දී සිසුන් අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇත. මෙම අධ්‍යයනය බණ්ඩාරවෙල ප්‍රදේශයේ සිසුන් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ දී මුහුණ දෙන අභියෝග හා ගැටලු පිළිබඳව තෝරාගත් රජයේ පාසල්වල සිසුන්, දෙමව්පියන්, ගුරුවරුන් ඇතුළු ප්‍රදේශවාසීන්ගේ අදහස් හා තොරතුරු එක්රැස් කරමින් විශ්ලේෂණය කර ඇත.

## 2. අධ්‍යයන ගැටලු

මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කර ඇති ගැටලුව වන්නේ සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හදාරන පාසල් සිසුන් මුහුණ දීමට සිදුව ඇති අපහසුතාවයන් වේ. ඒ අනුව, ඉස්ලාම් ධර්මය විෂය සඳහා නිසි රජයේ ගුරුවරු නොමැති වීම, ඉස්ලාම් ධර්ම විෂය සඳහා අදාල පාසල් පෙළපොත් සිසුන්ට නොලැබීම, සමහර පාසල් වල ඉස්ලාම් ධර්මය විෂය නොතිබීම හා එම විෂය හැදෑරීමේ දී විවිධ හේතූන් මත සමහර පාර්ශවයන්ගෙන් ඇතිවන බාධා යනාදී ගැටලු රැසක් පදනම් කරගනිමින් මෙම අධ්‍යනය සිදු විය. තවද මෙම ගැටලුව සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් විසින් ගනු ලබන විසඳුම් හුදෙක් තාවකාලික විසඳුම් බවට පත්වීමද අවධානය යොමුවිය යුතු තවත් විශේෂ ගැටළුවක් විය.

## 3. අධ්‍යයන ප්‍රශ්න

I. බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂයක් ලෙස හැදෑරීමේ දී පාසල් සිසුන් මුහුණ දෙන ගැටළු හා අභියෝග මොනවාද?
II. බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය හදාරන සිසුන් මුහුණ දෙන ගැටළු හා අභියෝග සඳහා බලපාන හේතු සාධක මොනවාද?

## 4. අධ්‍යයන අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු දෙකක් කේන්ද්‍රකොට ගනිමින් සිදුවිය. ·

- බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂයක් ලෙස හැදෑරීමේ දී පාසල් සිසුන් මුහුණ දෙන ගැටළු හා අභියෝග හඳුනා ගැනීම.
- බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය හදාරන සිසුන් මුහුණ දෙන ගැටළු හා අභියෝග සඳහා බලපාන හේතු සාධක හඳුනාගැනීම.

## 5. සාහිත්‍යය විමර්ශනය

වර්තමාන අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සාක්ෂරතාව තවදුරටත් ප්‍රමාණවත් නොවන බවයි. වර්තමාන අධ්‍යාපන ක්‍රමය දුර්වල ගුණාත්මකභාවය, පවත්නා ශ්‍රම වෙළඳපොළ ඉල්ලීම් සමඟ විෂයමාලා නොගැළපීම, පාසල් ගුරුවරුන් සඳහා පුහුණුවක් නොතිබීම සහ අකාර්යක්ෂම පරිපාලනය සම්බන්ධ ප්‍රධාන අභියෝග රැසකට මුහුණ දෙන බව පෙන්වා දෙයි (Liyanage, 2014). ශ්‍රී ලංකා ආණ්ඩුවේ විමධ්‍යගත පාසල් අධ්‍යාපන ක්‍රමය යටතේ, පාසල් වල සම්පත් කාර්යක්ෂමතාවය හා සිසුන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පවතින වෙනස්කම් අවබෝධ කර ගැනීමේ දී සිසුන්ගේ ක්‍රියාකාරීත්වය වැඩිදියුණු වී ඇති නමුත් පිරිවැයට සාපේක්ෂව කාර්යක්ෂමතාවක් දැක ගත නොහැකි බවයි. (Herath, 2008). මෙම අධ්‍යයනයේ ශ්‍රී ලංකාවේ තෘතීක අධ්‍යාපනය හා සම්බන්ධ තෝරාගත් අධ්‍යාපන ගැටළු පිළිබඳව ගැඹුරින් විමර්ශනය කරමින් ප්‍රධාන ගැටලු 03ක් තෝරාගෙන සාකච්ඡා කරයි. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සඳහා අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිචාර දැක්වීමේ හිඟතාවය, ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ විෂමතා, තාක්ෂණික

අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව නොමැතිකම යනාදි ගැටළු විසඳීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග වන්නේ වෘත්තීය පුහුණු වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා TVETS හි (තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව) ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කිරීමයි. (Gnanawasa & Lanka, 2017)

මෙවන් ශ්‍රී ලංකා අධ්‍යාපනය පිළිබඳව විවිධාකාර මාතෘකා පදනම් කරමින් අධ්‍යානයන් රැසක් දැකගත හැකි නමුත් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ දී පවතින ගැටලු සම්බන්ධයෙන් කිසිදු අධ්‍යයනයක් හෝ මූලාශ්‍රයක් මේ වන තෙක් හඳුනාගත නොහැකි විය. ඒ අනුව, සමාජයේ අවධානය යොමු නොවූ මෙම ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින් මෙම අධ්‍යයනය සිදු කර ඇති අතර අනාගතයේ මේ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදුකිරීමට ද සැලසුම් කර ඇත්තෙමු.

## 6. පර්යේෂණ ක්‍රමවේධ

මෙම අධ්‍යයනය, ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන ක්‍රම දෙක භාවිතා කරමින් බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් විෂය හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව පර්යේෂණ කර ඇත. ඒ අනුව බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපය සීමා කොටගත් මෙම අධ්‍යයනයේ purposive sampling method භාවිතයෙන් දත්ත එක් රැස් කර ගනු ලැබීය. තවද අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයට අයත් සිංහල මාධ්‍ය පාසල් අටක් (රජයේ පාසල් 7, අර්ධ රාජ්‍ය පාසල් 01ක්) තෝරා ගනු ලැබීය.

ඉස්ලාම් විෂය හැදෑරීම හා සම්බන්ධව විශේෂ ප්‍රශ්නාවලියක් සකසනු ලැබූ අතර, එය ගූගල් පොරෝමයක් (google form) ආකාරයෙන් 2021 වසරේ මැයි මස 17 වන දින සිට සති 2 ක් අදාල පාසල් වල ඉගෙන ගත් හා ඉගෙනුම ලබන සිසුන්ට වට්ස්ඇප් හරහා යවනු ලැබීය. එම කාලය තුළ අදාල පාසල් අටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ප්‍රතිචාර එකසිය එකක් ලබා ගත හැකි විය. මේ ආකාරයෙන් එම පාසල් වල සිසුන් මුහුණ දෙන ගැටළු හා අභියෝග සම්බන්ධ තොරතුරු සිසුන්ගෙන් ලබා ගන්නා ලදී. මීට අමතරව, දූරකථන ඇමතුම් හරහා එම අදාල පාසල් අටේ සිසුන්ගේ දෙමාපියන් සම්බන්ධ කරමින් දූරකථන ඇමතුම් මාර්ගයෙන් සාකච්ඡා පවත්වෙමින් දෙමාපියන්ගේ තොරතුරු එක් රැස් කර ගනු ලැබීය. තවද දූරකථන ඇමතුම් හරහා බණ්ඩාරවෙල ප්‍රදේශයේ ගුරුවරු කිහිප දෙනෙකු ඇතුළු රජයේ නිලධාරීන් කිහිප දෙනෙකු සම්බන්ධ කරමින් අදාළ ලිපි ලේඛනයක් ඇතුළු තොරතුරු ද රැසක් ලබා ගනු ලැබිය. ගූගල් පොරෝමය (google form) හරහා සිසුන් ලබා දුන් දත්ත SPSS උපයෝගී කරගනිමින් වැඩිදුර විශ්ලේෂණය කරන ලදී. තවද දෙමව්පියන්, ගුරුවරුන් , ගම්වාසීන් හා රජයේ නිලධාරීන් යන සියල්ලන්ගෙන් එක්රැස් කර ගත් තොරතුරු සංසන්දනාත්මක ව හා ක්‍රමක් ක්‍රමයෙන් අධ්‍යයනය කොට විශ්ලේෂණය කරන ලදී.

## 7. සොයා ගැනීම් හා සාකච්ඡා

මෙම අධ්‍යානය සඳහා ප්‍රශ්නාවලිය මගින් ප්‍රතිචාර එකසිය එකක් ලබා ගත හැකි වූ අතර එම ප්‍රතිචාර ලබා දුන් ඉස්ලාම් දහම අදහන සිසුන්ගේ තොරතුරු පහත පරිදි වේ.

| ස්ත්‍රී පුරුෂ භාවය | ප්‍රතිශතය % |
|---|---|
| පුරුෂ | 59 |
| ස්ත්‍රී | 41 |

(වගු අංක 01)

| ඉගෙනුම ලබන පාසල | ප්‍රතිශතය % |
|---|---|
| බ/ මධ්‍ය මහා විද්‍යාලය | 10 |
| බ/ විශාකා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය | 18 |
| බ/ කුඩා කුසුම් බාලිකා මධ්‍ය මහා විද්‍යාලය | 16 |
| බ/ ශාන්ත ජෝශප් මධ්‍ය මහා විද්‍යාලය | 18 |
| බ/ ශාන්ත තෝමස් විද්‍යාලය | 10 |
| බ/ සීවලි නවෝදයා විද්‍යාලය | 6 |
| බ/ ධර්මපාල නවෝදයා විද්‍යාලය | 5 |
| බ/ ධර්මාශෝක මධ්‍ය මහා විද්‍යාලය | 18 |

**(වගු අංක 02)**

| ඉගෙනුම ලබන වසර | ප්‍රතිශතය % |
|---|---|
| 12 - 13 වසර | 15 |
| 8 - 11 වසර | 29 |
| පැරණි ශිෂ්‍ය | 56 |

**(වගු අංක 03)**


**වගු අංක 03** ට අනුව ප්‍රතිචාර ලබා දුන් සිසුන් ගෙන් 56%ක් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වන අතර 44%ක් 8 ශ්‍රේණියේ සිට 12 ශ්‍රේණිය දක්වා දැනට පාසල් අධ්‍යාපනය හදාරන සිසුන් ය. එසේම බ/ විශාඛා බාලිකා මහා විද්‍යාලය, බ/ ධර්මාශෝක මධ්‍ය මහා විද්‍යාලය හා බ/ ශාන්ත ජෝසප් මධ්‍ය මහා විද්‍යාලය යන පාසල් තුනේ ම 18% ක සමාන ප්‍රතිශතයක ප්‍රතිචාර ලැබී ඇති අතර, ධර්මපාල නවෝදයා විද්‍යාලයේ සිසුන්ගෙන් (5%) අවම ප්‍රතිචාරයක් ලැබී ඇති බව **වගු අංක 02** න් පෙන්නුම් කරයි.

පාසල් විෂයමාලා අතරින් ආගමික විෂය ලෙස ඉස්ලාම් විෂය හැදෑරීම සම්බන්ධයෙන් එම සිසුන්ගෙන් විමසන ලද ප්‍රශ්නයට ඔවුන් දැක්වූ ප්‍රතිචාරය **රූප අංක 1 හී** දැක්වේ.




**(රූප අංක 01)**


මේ අනුව 64%ක ප්‍රතිශතයක සිසුන් තම පාසල් කාලය තුළ ඉස්ලාම් විෂය හදාරා නොමැති යන්නෙන් සඳහන් කර ඇත. තවද සිසුන්ගෙන් 17% ක ප්‍රතිශතයක් ඉස්ලාම් විෂය හදාරන අතරම 19%ක ප්‍රතිශතයක සිසුන් යම් කාලයක් ඉස්ලාම් ධර්මය විෂය හදාරා ඇති බව පැහැදිලි වේ. ඉස්ලාම් ධර්ම විෂය හදාරන හෝ යම් කාලයක් හදාරා ඇති සිසුන්ගෙන් ( මුළු සිසුන්ගෙන් 36%ගෙන්) ඉස්ලාම් ධර්ම විෂය සඳහා අවශ්‍ය පහසුකම් ලැබී ඇත්දැයි විමසීමේ දී ඒ පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාර පහත **රූප අංක 02** හී දැක්වේ.




**(රූප අංක 02)**

එම සිසුන්ගෙන් සියයට 81% ක ප්‍රතිශතයකට ඉස්ලාම් විෂය සඳහා පාසල් පෙළපොත් ලැබී ඇති අතර 71%ක ප්‍රතිශතයක සිසුන්ට වාර විභාග ප්‍රශ්න පත්‍ර ද ලැබී ඇත. තවද 38% ක ප්‍රතිශතයක සිසුන්ට පමණක් පිළිගත් රජයේ ගුරුවරු ලැබී ඇති බව සඳහන් ය. ඉස්ලාම් විෂය සම්බන්ධ පුස්තකාල පොත් පත් (12%) හා විභාග ආසන්නව පවත්වන සම්මන්ත්‍රණ(10%) ආදී පහසුකම් ඉතා අඩු ප්‍රතිශත ප්‍රමාණයකින් ඔවුන්ට ලැබී ඇති බව පෙනී යයි. මේ පිළිබඳව අදහස් දක්වන සමහර සිසුන් කියා සිටියේ මින් කිසිදු පහසුකමක් ඔවුන්ට නොලැබුණු අතර පෞද්ගලිකව වියදම් කරමින් ඉස්ලාම් විෂය හැදෑරූ බවයි.

තවද ඉස්ලාම් විෂය හදාරා නොතිබීම සම්බන්ධයෙන් හේතුව විමසීමේ දී ඔවුන් ලබාදුන් ප්‍රතිචාර **රූප අංක 03** හී දැක්වේ.




**(රූප අංක 03)**

එම දත්ත දෙස අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ 89% ක ප්‍රතිශතයක සිසුන්ට විවිධ බාධක හේතුවෙන් ඉස්ලාම් විෂය හැදෑරීමේ අවස්ථාව අහිමි වී ඇති බවයි. ඒ අතරින් 11%ක ප්‍රතිශතයක සිසුන් ස්ව කැමැත්ත මත ඉස්ලාම් විෂය හදාරා නොමැත යන්නෙන් ප්‍රතිචාර ලබා දී ඇත. මේ අනුව තමන් අදහන ආගමික විෂය හැදෑරීමේ අවස්ථාව අහිමි වීම ඔවුන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය යම් ආකාරයකින් උල්ලංඝනය වන වාද යන්නෙන් විමසීමේ දී ඔවුන් ලබා දුන් ප්‍රතිචාරය පහත **(වගු අංක 04)** පරිදි විය.

| නිදහස් අධ්‍යාපනයේ අයිතිවාසිකම උල්ලංඝනය වීම | ප්‍රතිශතය % |
|---|---|
| ඔව් | 73 |
| නැත | 27 |

**(වගු අංක 04)**

එම සිසුන්ගෙන් 73% මේ හරහා නිලධාරීන් තමාගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය යම් ආකාරයකින් උල්ලංඝනය වන බවට එකඟ වන අතරම 27% ප්‍රතික්ෂේප කරයි. මීට අමතරව සිසුන්ගේ දෙමව්පියන් හා අදාළ ගුරුවරුන්ගේ මතය විමසීමේ දී පෙනී ගියේ සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් විෂය ඉගෙනීමේ අවස්ථාව විවිධ බාධකයන් හේතුවෙන් අහිමි වීම නිදහස් අධ්‍යාපනය භුක්ති විඳින එම සිසුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන බවයි.

එසේම පහත **(වගු අංක 05)** දත්ත අනුව ඉස්ලාම් ධර්ම විෂය වෙනුවට වෙනත් ආගමික විෂයක් හදාරනු ලබන්නේ දැයි විමසීමේ දී එම සිසුන්ගෙන් 81% ක ප්‍රතිශතයක් එයට ඔව් යන්නෙන් එකඟ වී ඇත. එසේ


ඉස්ලාම් ධර්ම විෂය වෙනුවට ධර්ම විෂයක් ලෙස හදාරන අනෙකුත් ආගමික විෂයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම 81% ක ප්‍රතිශතයක සිසුන්ගෙන් 94% ක ප්‍රතිශතයක සිසුන් බුද්ධාගම ද **1**% ක ප්‍රතිශතයක සිසුන් ක්‍රිස්තියානි ධර්මය ද 5% ක සිසුන් කතෝලික ධර්මය ද හදාරනු ලබයි.

| **ඉස්ලාම් විෂය හැදෑරීමට නොහැකි අවස්ථාවේ වෙනත් ආගමික විෂයයක් හැදෑරීම** | **ප්‍රතිශතය%** |
|---|---|
| ඔව් | 81 |
| නැත | 19 |
| **ඉස්ලාම් වෙනුවට හදාරන හෝ හැදෑරූ අනෙක් ආගමික විෂය** | |
| බුද්ධාගම | 94 |
| ක්‍රිස්තියානි ධර්මය | 1 |
| කතෝලික | 5 |
| **අන්‍යාගමික විෂයක් හැදෑරීමේ දී විභාග ප්‍රතිඵල වලට සෘණාත්මක බලපෑමක් ඇති වීම** | |
| ඔව් | 43 |
| නැත | 57 |

**(වගු අංක 05)**

තවද තමන් අදහන ආගම වෙනුවට වෙනත් ආගමික විෂයයන් හැදෑරීම ඔවුන්ගේ විභාග ප්‍රතිඵල සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කරනවා දැයි ප්‍රශ්න කිරීමේදී 57% ක ප්‍රතිශතයක සිසුන් ප්‍රතිචාර ලබා දී ඇත්තේ සෘණාත්මක බලපෑම් ඇති නොකරන බවයි. තවද සෘණාත්මක බලපෑම් ඇතිවන බව සඳහන් කරන 43%.ක ප්‍රතිශතයක සිසුන්ගෙන් මේ පිළිබඳව ඔවුන්ගේ අදහස් විමසීමේ දී ඔවුන්ගේ පොදු මතය වූයේ එම ආගම් වල මූලික දැනුම නොමැති වීම හේතුවෙන් ඉගෙන ගැනීමේ දී මතක තබා ගැනීමට අපහසු බැවින් විභාග ලකුණු අවම වීමක් සිදු වන බවයි.

සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීමේ අවස්ථාව අහිමි වූ හා ඉස්ලාම් ධර්ම විෂය හදාරන හෝ යම් කාලයක් හැදෑරූ සිසුන්ගෙන් මෙම ගැටලුව සඳහා ඔවුන්ට තිබුණු බාධක එනම් හේතු සාධක පිළිබඳව විමසීමේ දී ඔවුන් ලබාදුන් ප්‍රතිචාර **රූප අංක 04 හි** දැක්වෙන පරිදි වේ.




**(රූප අංක 04)**

ඉහත දත්ත අනුව 88% කට සමාන ප්‍රතිශතයක සිසුන්ගේ ගැටලුව ලෙස සඳහන් කර තිබෙන්නේ ඔවුන්ගේ පාසල් වල ඉස්ලාම් විෂය නොමැති වීම හා ඒ සඳහා අවශ්‍ය රජයේ ගුරුවරු නොසිටීමයි. තවද පාසල් පුස්තකාලවල ඉස්ලාම් විෂය සම්බන්ධ පොත්පත් නොතිබීමයි (75%), ඉස්ලාම් විෂය සඳහා අවශ්‍ය රජයේ පෙළ පොත් නොතිබීම (54%), අනික් ආගමික විෂයයන් සඳහා තිබෙන ප්‍රමුඛත්වය ඉස්ලාම් විෂයට නොතිබීම (48%) හා විවිධ පාර්ශවයෙන් ගේ බලපෑම් (33%) යනාදීන් ඔවුන් මුහුණ දීමට සිදුව ඇති අභියෝගයන් ලෙස තහවුරු වේ.

මෙම සිසුන් මුහුණ දෙන අභියෝග ගැටලු පිළිබඳව ඔවුන්ගේ දෙමව්පියන් ගුරුවරුන් ඇතුළු සමහර රජයේ නිලධාරීන් ගෙන් විමසූ විට බොහෝ දුරට සිසුන්ගේ ප්‍රතිචාරවලට සමාන ප්‍රතිචාරයක් ඔවුන්ගෙන් ලැබීය. ඉස්ලාම් ධර්ම විෂය සඳහා අවශ්‍ය රජයේ ගුරුවරු නොමැති වීම, අදාල පාසල් පෙළපොත් නොතිබීම හා සමහර පාසල් වල විදුහල්පතිවරුන් ඉස්ලාම් ධර්මය විෂය ඉගැන්වීමට අවසර ලබා නොදීම යනාදි ප්‍රධාන ගැටලු ලෙස ඔවුන් සඳහන් කරන ලදී.

කෙසේ නමුත් අදාළ පාසල්වල සිසුන්ගේ දෙමව්පියන් ගම්වාසීන් ගුරුවරුන් ඇතුළු සමහර රජයේ නිලධාරීන් මෙම ගැටලු සඳහා විසඳුමක් ලබාදෙන ලෙස බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයෙන් ඉල්ලා සිටි අතර එයට ප්‍රතිචාරයක් වශයෙන් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් එම සිසුන්ට ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීමට අවස්ථාව ලබා දිය යුතු යන්නෙන් හා ස්වෙච්ඡා ගුරුවරුන් හරහා ඉස්ලාම් ධර්මය විෂය ඉගැන්වීමට අවසර ලබා දෙන ලෙස සඳහන් කර ලිපි හරහා එම පාසල්වල විදුහල්පතිවරු දැනුවත් කරන ලදී.

ඒ අනුව සමහර පාසල්වල විදුහල්පතිවරුන් එයට අවසර ලබා දෙමින් ධනාත්මක ප්‍රතිචාර ලබා දුන්න ද සමහර පාසල් වල එය ප්‍රතික්ෂේප කරන ලදී. ඒ සඳහා සාධාරණ පිළිගත හැකි හේතුවක් සඳහන් නොකරන අතර මේ වන තෙක් එම පාසල්වල ඉස්ලාම් ධර්මය විෂය ඉගැන්වීමට අවසර ලබා දී නොමැත. එමෙන්ම අදහස් දක්වමින් එක් ගුරුවරයෙක් කියා සිටියේ එම පාසල්වල ඉස්ලාම් ධර්මය විෂයක් ලෙස නොතිබීම හේතුවෙන් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉස්ලාම් විෂය තෝරා ගැනීමට අවස්ථාව ලබා නොදෙන බවයි. මේ සම්බන්ධව තොරතුරු ලබාදීමේදී එක් මවක් කියා සිටියේ ඉස්ලාම් විෂය සඳහා සිසුන්ගේ ප්‍රතිඵල සඳහා පාසල මගින් වගකීම් දරන්නේ නැත යන්නෙන් එම පාසලෙන් පවසා ඇති බවයි. කෙසේ නමුත් ප්‍රතිචාර ලබා දුන් සිසුන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ගෙන් බොහෝ දෙනෙකු අදහස් දැක්වීමේ දී කියා


සිටියේ එම සමහර පාසල්වල ඉස්ලාම් ධර්මය හැර අනෙකුත් ආගමික විෂයයන් ඇතුළු තවත් සමහර විෂයයන් සඳහා රජයේ ගුරුවරු නොමැති වුවද එම විෂයයන් රජයේ නොවන වෙනත් ගුරුවරු මාර්ගයෙන් සිසුන්ට ඉගැන්වීමට අවසර ලබා දී ඇති බවයි.

අපට තොරතුරු ලබාදුන් ගුරුවරුන් හා රජයේ නිලධාරිවරයා ප්‍රධාන වශයෙන් කියා සිටියේ සෑම පාසලකම මුස්ලිම් දරුවන් 50 ට වැඩිය සිටින බැවින් ඉස්ලාම් ධර්මය විෂය සඳහා ගුරුවරයෙකු අනිවාර්යයෙන් ලබා දිය යුතු වුවත් මෙම ප්‍රදේශයෙන් කිසිදු දිනක ගුරු පුරප්පාඩු නොපෙන්වීම ගැටලුවක් වන බවයි. මන්දයත් පාසල් වාර්තා තුළින් පෙන්නුම් කරනු ලබන්නේ මුස්ලිම් දරුවන් සියල්ල අන්‍ය ආගමික විෂයයන් තෝරා ගැනීම හේතුවෙන් ඉස්ලාම් ගුරුවරයෙකු අවශ්‍ය නොවන බවයි.

මහ පල්ලිය මගින් මෙම ගැටළු සඳහා පියවර කිහිපයක් ගනු ලැබූ අතර සමහර පාසල් වල බණ්ඩාරවෙල මහ පල්ලිය විසින් ගෙවීම් සිදු කරමින් ස්වේච්ඡා ගුරුවරු ලවා ඉස්ලාම් ධර්මය විෂය ඉගැන්වූ බව ප්‍රතිචාර ලබා දුන්නත් සඳහන් කරන ලදී. කෙසේ නමුත් කලාප අධ්‍යාපන කාර්යාලයෙ ලිපිය පිළිගත් සමහර පාසල් වල ස්වෙච්ඡා ගුරුවරු මාර්ගයෙන් ඉගැන්වීමේ ක්‍රමය තාවකාලික විසඳුම් බවත් දිගු කාලයක් නොපැවැත් වූ බව ඔවුන්ගේ තොරතුරු මගින් දෙන ගත හැකි විය.

බ/ ශාන්ත ජෝසප් මධ්‍ය මහා විද්‍යාලයේ වසර දෙකක (2013-2015) ඉස්ලාම් විෂය සඳහා ස්වේච්ඡා ගුරුවරියක් ලෙස කටයුතු කළ ගුරුවරියක් අදහස් දැක්වීමේදී කියා සිටියේ ඉස්ලාම් විෂය සඳහා සිසුන් හා දෙමව්පියන් වැඩි උනන්දුවක් නොදක්වන අතර එම ස්වෙච්ඡා ගුරුවරු අතරමග දී නැවැත් වූ විට තම ළමයින්ගේඅධ්‍යාපනය කඩා කප්පල් වේ යන බිය මත සමහර දෙමව්පියන් ඉස්ලාම් ධර්මය විෂය සඳහා උනන්දුවක් නොදක්වන බවයි. එම පාසලේ ම විදුහල්පතිවරුන් තිදෙනෙක් යටතේ ඉස්ලාම් විෂය සඳහා ස්වේච්ඡා ගුරුවරියක් ලෙස සේවය කිරීමේ දී විදුහල්පතිවරුන්ගේ සහයෝගය ලැබූ බව සඳහන් කරන අතරම ස්වේච්ඡා ගුරුවරියක් ලෙස ඉගැන්වීමේ දී ඇයට කිසිදු ආකාරයෙන් ගෙවීමක් සිදු නොකළ බවද සඳහන් කර සිටියාය. බණ්ඩාරවෙල ජුම්මා මස්ජිදය මගින් මෙම ගැටලුව සඳහා ස්ථිර විසඳුමක් ලබා ගැනීමට උත්සහ නොකිරීම, ස්වේච්ඡා සේවක ගුරුවරියක් සේවයට යොමු කල ද කිසිදු ගෙවීමක් සිදු නොකිරීම හා එක් ගුරුවරයෙකු ඉවත් වූ විට තවත් ගුරුවරයෙකු සේවයට යෙදවීමට උනන්දුවක් නොදැක්වීම යනාදී කරුණු සම්බන්ධයෙන් ද එම ගුරුවරිය තවදුරටත් කියා සිටියාය.

කෙසේ නමුත් මේ වන විට එම පාසල්වල ස්වෙච්ඡා ගුරුවරුන් විසින් ඉස්ලාම් ධර්ම විෂය උගන්වනු නොලබන අතර එක් ගුරුවරයකු කියා සිටියේ චක්‍ර ලේඛනය මගින් වර්තමානයේ ස්වේච්ඡා ගුරුවරු තහනම් කර ඇති බවයි. ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීමට බාධා එල්ල කරන පාර්ශවයන් පිළිබඳව සිසුන්ගෙන් විමසීමේ දී ඔවුන්ගේ ප්‍රතිචාර **රූපය 05** හි නිරූපනය වේ.




**(රූප අංක 05)**

69% ක ප්‍රතිශතයක සිසුන් සදහන් කර ඇත්තේ කිසිම පාර්ශවයකින් කිසිදු බාධාවක් ඇති නොවූ බවයි. තවත් සමහර සිසුන් සදහන් කර ඇත්තේ ගුරුවරුන්ගෙන් (29%) හා විදුහල්පතිවරුන් ගෙන් (17%) ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීම සඳහා බාධා ඇති බවයි. තොරතුරු ලබාදුන් සමහර දෙමව්පියන් හා ගුරුවරුන් සඳහන් කළේ සමහර පාසල් වල විදුහල්පතිවරුන් හා අංශභාර ප්‍රධානීන් විසින් ඉස්ලාම් ධර්මය විෂය ඉගැන්වීමට සෘණාත්මක බලපෑම් සිදු කරන බවයි.

| පාසලේ අනෙකුත් ආගමික විෂයයන් පහසුකම් ලබා දීම | ප්‍රතිශතය % |
|---|---|
| ඔව් | 99 |
| නැත | 1 |
| **ඉස්ලාම් අධ්‍යයනය සම්බන්ධයෙ ගැටලු විසඳීමට ක්‍රියාමාර්ග ගැනීම** | |
| ඔව් | 19 |
| නැත | 81 |

**(වගු අංක 06)**

එම සිසුන්ගෙන් තම පාසල් වල අනෙකුත් විෂයන් සඳහා ගුරුවරුන් මෙන්ම පාසල් පෙළපොත් යනාදී පහසුකම් තිබේ දැයි විමසීමේ දී ඔවුන් ලබා දුන් ප්‍රතිචාර ඉහත **වගු අංක 06** හී නිරූපනය වේ. ඒ අනුව බලන විට 99%ක ප්‍රතිශතයක සිසුන්ගේ පිළිතුර වී ඇත්තේ අනිකුත් විෂයන් සඳහා සියලු පහසුකම් තිබේ යන්නයි. තවද ඉස්ලාම් විෂය සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටලු සඳහා පාසල් අධ්‍යාපනය හදාරන සිසුන් වශයෙන් ඔවුන් මේ පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන ඇත්දැයි විමසීමේදි, ඔවුන්ගේ ප්‍රතිචාර අතරින් 81%ක ප්‍රතිශතයක සිසුන්

මේ පිළිබඳ කිසිදු පියවරක් නොගත් අතර තවත් සමහර සිසුන් තමන්ට හැකි පමණින් පියවර ගත් බව සඳහන් කර ඇත. ඒ අනුව ඔවුන් ගත් පියවර පිළිබඳ විමසීමේ දී එම සිසුන්ගෙන් බොහෝ දෙනෙකු සඳහන් කර සිටියේ මෙම ගැටළුව විසඳා දෙන ලෙස විදුහල් පාසලේ විදුහල්පතිගෙන් ඉල්ලා සිටි නමුත් කිසිදු විසඳුමක් අද වෙන තෙක් ලැබී නොමැති යන්නයි. මීට අමතරව තවත් සිසුන් සඳහන් කර සිටියේ දෙමව්පියන් හා විවිධ නායකයින් මාර්ගයෙන් විසඳුම් ලබා ගැනීමට උත්සාහ කළ ද එය හුදෙක් තාවකාලික විසඳුම් වූ බවයි.

## 8. නිගමන

ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය අනුව සිසුන් තමන් අදහන ආගම හෝ තමන්ගේ මව් බස කුමක් වුව ද ඕනෑම භාෂා මාධ්‍යයකින් නිදහස් අධ්‍යාපනය භුක්ති විඳීමේ අයිතිය ඔවුන් සතුය. සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ දී  සිසුන් මුහුණ දෙන අභියෝග හා ඊට හේතු සාධක හඳුනා ගැනීමේ අරමුණින් දියත් කළ මෙම අධ්‍යයනය බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය පාසල් අටක් කේන්ද්‍ර කොට ගනිමින් සිදු විය. මෙහි දී purposive sampling method භාවිතා කරමින් දත්ත එක්රැස්  කරනු ලැබූ අතර  ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන ක්‍රම දෙක භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදි. එම තෝරාගත් පාසල් අටේ සිසුන්, ඔවුන්ගේ දෙමව්පියන්, ගුරුවරුන්  හා සමහරක් රජයේ නිලධාරීන් යන්නන් සම්බන්ධ කරමින්  ප්‍රශ්නාවලි, දුරකථන සංවාද හා  සම්මුඛ සාකච්ඡා පවත්වමින් මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත එක් රැස් කර ගනු ලැබීය. දත්ත විශ්ලේෂණ අනතුරුව අනාවරණය වූයේ ඉස්ලාම් විෂය සඳහා රජයේ ගුරුවරු නොමැතිවීම, එම විෂයය සඳහා රජයේ පෙළපොත් සිසුන්ට නොලැබීම හා විවිධ පාර්ශවයන්ගේ බලපෑම යනාදී තවත් අභියෝග රැසකට සිසුන් මුහුණ දීමට සිදුව ඇති බවයි. තවද සමහර සිසුන්ට සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීම අවස්ථාව අහිමි වී ඇති අතර ඒ වෙනුවට වෙනත් ආගමික විෂයයක් හැදෑරීමට සිදුව ඇති බව තවදුරටත් තහවුරු වී ඇත. බණ්ඩාරවෙල මහ පල්ලිය, සිසුන්ගේ දෙමව්පියන්, ගුරුවරුන් හා සමහර රජයේ නිලධාරීන් මෙම  ගැටලුව විසඳීමට පියවර රැසක් ගනු ලැබුවද අද වන තෙක් කිසිදු ස්ථිර විසඳුමක් ලබාගත නොහැකි වී ඇත. එමෙන්ම මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා ඔවුන් විසින් වැදගත් යෝජනා රැසක් ඉදිරිපත් කර තිබුණි.  ඒවා හුදෙක් යෝජනා ලෙස පමණක් නොපවත්වා නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තුළින් එම පාසල්වල සිසුන්ට සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ අවස්ථාව ලබා දිය හැක. ශ්‍රී ලංකාවේ සියලු පාසල්වල සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්මය විෂය හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව මින් ඉදිරියට අධ්‍යනය සිදුකිරීමට අප සැලසුම් කර ඇත්තෙමු.

## 9. යෝජනා

මෙම අධ්‍යයනයේ දී ප්‍රතිචාර ලබා දුන් සිසුන්,  දෙමාපියන් ගුරුවරුන් ඇතුළු රජයේ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් මෙම ගැටළුව සම්බන්ධයෙන් විවිධ යෝජනා ඉදිරිපත් කරනු ලැබීය. කෙසේ වෙතත් සමස්ථ දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව ඔවුන්ගේ යෝජනා අතරින් අප විසින් අනුමාන කරන යෝජනා වශයෙන් පහත සඳහන් යෝජනා හැඳින්විය හැකිය.

- බණ්ඩාරවෙල ප්‍රදේශයෙහි සිංහල භාෂා මාධ්‍යයෙන් ඉස්ලාම් ධර්ම විෂය හැදෑරීමේ දී සිසුන් මුහුණ දෙන අභියෝග රජයේ අදාල නිලධාරීන් ගේ අවධානයට යොමු කිරීම.
- මෙම ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජමියතුල් උලමා සභාවේ අවධානයට යොමු කිරීම සඳහා පියවර ගැනීම.
- රජයෙන් ඉස්ලාම් විෂය සඳහා ලබා දෙන පාසල් පෙළ පොත් සිසුන්ට නොලැබීමේ හේතුව හඳුනාගෙන ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම.
- එම පළාතේ ගුරුවරුන් නොමැති හෙයින් ඉස්ලාම් විෂය සඳහා වෙනත් පළාත් වලින් ගුරුවරු ගෙන්වා ඉගෙන්වීම.

- ඉස්ලාම් ධර්ම විෂය සඳහා ඇති ගුරු පුරප්පාඩු පිරවීමට උපාධිධාරී මවුලවිවරුන් හටද රජයේ ගුරු පත්වීම් ලබාදීම.
- අදාල රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් එම පාසල්වල විදුහල්පතිවරුන් සමග මේ සම්බන්ධ කරුණු සාකච්ඡා කරමින් හෝ වෙනයම් ඵලදායි ආකාරයකින් එම පාසල් වල ඉස්ලාම් ධර්මය විෂය සඳහා අවසර ලබාදීම.
- වාර විභාග සඳහා අවශ්‍ය ප්‍රශ්න පත්‍ර ලබාදීම සඳහා නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට අවධානය යොමු කිරීම.
- බණ්ඩාරවෙල වල මහ පල්ලිය විසින් හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලය මගින් විභාගයට ආසන්නව ඉස්ලාම් විෂය සඳහා සිංහල මාධ්‍යයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.
- රජයෙන්, බණ්ඩාරවෙල මහ පල්ලියෙන් එම පාසල් වල පුස්තකාලය සඳහා අවශ්‍ය ඉස්ලාම් ධර්ම විෂය සම්බන්ධ පොත්පත් ලබා දීම

## 10. විමර්ශිත මූලාශ්‍ර


Aturupane, H., & Little, A. W. (2020). *General Education in Sri Lanka* (Issue November). https://doi.org/10.1007/978-981-13-3309-5_18-1

(divisional secretariat- bandarewala, n.d.)

Gnanawasa, R. M., & Lanka, S. (2017). a Study of a Few Recognized Educational. *Conference*.

Liyanage, I. M. K. (2014). *Education System of Sri Lanka : Strengths and Weaknesses*. 116–140.

Herath, T. N. (2008). An assessment of decentralized government school education in Sri Lanka. KEDI Journal of Educational Policy, 5(1), 19–48.

(1945 Free Education Policy in Sri Lanka, n.d.)

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, n.d.)